පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 492

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභා ගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයා ගේනිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉතිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் : மாவட்டச் செயலகம், மன்னார்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Series No : 492**

**Name of the institution: District Secretariat, Mannar**

**Submission of observation of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)**

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පොදු ගිණුම් කාරක සභාවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තොරතුරු සැපයීම

පාර්ලිමේන්තු යොමු අංකය: 492

ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම

| අ.අ | කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය |
|---|---|---|
| 01 | විගණකාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර, දැනට මාසයක් ඇතුළත පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත. |
| 02 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර, දැනට මාසයක් ඇතුළත පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත. |
| 03 | වාහනයක් ගරහිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි. | අදාළ වාහනය ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) වෙත භාර දීමෙන් අනතුරුව, රුපියල් 4,950,000.00 ක රක්ෂණ වන්දි මුදලක් සාර්ථකව අය කරගෙන ඇති අතර, එම වාහනය 18.09.2024 දින පොත්වලින් ඉවත් කිරීමට (Write off) අවශ්‍ය පියවර ගෙන ඇත. |
| 04 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශයේ ගැලපීම් සිදු නොකිරීමට හේතුව - අදාළ චෙක්පත් වංචාව සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විධිමත් පියවර ගෙන ඇති අතර, වන්දි මුදල අදාළ නිලධාරියාගෙන් වාරික පදනම මත එකතු කරනු ලැබේ. වංචාවට ලක්වූ රුපියල් 1,371,155.87 ක මුදලින් රුපියල් 1,021,300.00 ක් දැනට අයකර ගෙන ඇති අතර ඉතිරි රුපියල් 349,855.87 ක මුදල අයකර ගැනීමට පියවර ගෙන ඇත. තවද, මේ සම්බන්ධයෙන් අධිකරණ නඩුව විභාග වෙමින් පවතී. |
| 05 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | වසරකට අධික කාලයක් තිස්සේ නොගෙවා පවතින හිඟ ණය ශේෂයන්, සේවය අත්හැර ගිය සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ට අයත් වේ. අදාළ ණය එකඟතා ගිවිසුම්වලට යටත්ව, එම හිඟ ණය මුදල් දැනට ඔවුන්ගේ |

| | | |
|---|---|---|
| | | ඇපකරුවන්ගෙන් මාසිකව අයකර ගනු ලැබේ.<br>තවද, සේවය අත්හැර ගොස් ඇති මලිස් මහතා වෙනුවෙන් ඇපකරුවෙකු නොමැති වීම හේතුවෙන්, ඔහු විසින් ගෙවිය යුතු රු. 6,750.00 ක හිඟ උත්සව අත්තිකාරම් මුදල සෘජුවම ඔහුගෙන් අයකර ගැනීමට දැනට පියවර ගෙන ඇත. |
| 06 | දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව දැනට කාර්තුමය පදනමින් පවත්වනු ලබන අතර, ඉදිරියේදී එම රැස්වීම් මාසිකව කැඳවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| 07 | දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු රැස්වීම් දැනට කාර්තුමය පදනමින් පවත්වනු ලබන අතර, ඉදිරියේදී එම රැස්වීම් මාසිකව පැවැත්වීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| 08 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | ආයතනයේ ගිණුම් පිළිබඳ සුදුසුකම් ලත් විගණන මතයක් හැකි ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කර ඇත. |

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ක.කනකේස්වරන්
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මන්නාරම දිස්ත්‍රික්

ප්‍රධාන ගණකාධිකාරි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

K.Yogendran
Chief Accountant
District Secretariat
Mannar.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.